# පළාත් අධ්‍යාපන කාර්යාලය - උතුරු පළාත
மாகாணக் கல்வி அலுவலகம் - வட மாகாணம்
# තුන් වන වාර පරීක්ෂණය - 2017
மூன்றாம் தவணை பரீட்சை - 2017
## (64) දෙවන බස (සිංහල)
இரண்டாம் மொழி சிங்களம்
## I පත්‍රය

11 ශ්‍රේණිය    කාලය පැය 01 යි

---

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. எல்லா வினாக்களுக்கும் விடை தருக.

- නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් **තද කළු අකුරින්** ඇති පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පදය තෝරන්න.
  1 - 5 வரையுள்ள வினாக்களில் **தடித்த எழுத்தில்** தந்துள்ள சொற்களுக்குப் பொருத்தமான சொல்லைத் தெரிவு செய்க.

1. පුතා පරිස්සමින් **ගිහින්නෙන්න.**
   1) ගිහිංනෙන්න  2) ගිහින් එන්න  3) ගිහිනෙන්න  4) ගිහි එන්න
2. මෙන්න **ටෝකන්නෙක**
   1) ටෝකන් එක  2) ටෝකන්ක  3) ටෝක එක  4) ටෝකන් නෙක
3. ආයෙත්තෙහෙම වැරදි වැඩ කරන්න එපා.
   1) ආයෙ එහෙම  2) ආයෙත් තෙහෙම  3) ආයත් එහෙම  4) ආයෙත් එහෙම
4. සාමාජික කාඩ් පත **ගන්නෝනෑ**
   1) ගන් ඕනෑ  2) ගන ඕනෑ  3) ගන්න ඕනෑ  4) ගන්න නෝනෑ
5. එහෙ මෙහෙ ඇවිදින්න **යන්නෙපා.**
   1) යන්න එපා  2) යන් එපා  3) යන්නෙඑපා  4) යන්නනෙපා

- අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරින් නිවැරදි උච්චාරණය සහිත පදය තෝරන්න.
  6 - 10 வரையான வினாக்களுக்கான **சரியான உச்சரிப்பைத்** தரும் சொல்லைத் தெரிவு செய்க.

6. 1) පෝස්ටරය  2) පෝච්ටරය  3) පෝස්ඩරය  4) පෝස්ට්‍රය
7. 1) පත්රය  2) පත්‍රය  3) පත්තිරය  4) පත්ත්‍රය
8. 1) තිරිකෝණය  2) තිරික්කෝණ  3) ත්‍රිකෝණය  4) ත්‍රිරිකෝණ
9. 1) අදීවේකී  2) අදිවේකි  3) අධිවේකි  4) අධිවේගි
10. 1) ග්රාමසේවා  2) ග්‍රාමසේවා  3) ග්‍රිරාමසේවා  4) ග්‍රීමසේවා

- අංක 11 සිට 14 තෙක් ඇති එක් එක් ප්‍රකාශය සඳහා වඩාත් ගැලපෙන ප්‍රශ්නය තෝරන්න.
  11 – 14 வரையான வினாக்களுக்கு **மிகப் பொருத்தமான** வினா வாக்கியத்தைத் தெரிவு செய்க.

11. අපේ නිවාසයේ නම නෙළුම්
    1) නිවාසයේ නම මොනවාද?  2) නිවාස නම මොනවාද?
    3) නිවාසයේ නම මොකක්ද?  4) නිවාසයේ නම මොකද?

12. නිවාඩු කාලයේ අපි කෞතුකාගාරය බලන්න යමු.
    1) යන්නේ කොහේද?  2) යන්න කොහේද?
    3) යනවා කොහොමද?  4) යනවා කොහේද?



kalvi.lk

13. ප්‍රවේශ පත්‍ර දොරටුවෙන් ලබා ගන්න.

1) ප්‍රවේශ පත්‍ර ගන්න කොහෙද? 2) ප්‍රවේශ පත්‍ර ගන්නේ කොහෙන්ද?
3) ප්‍රවේශ පත්‍ර ගන්නවා කොහෙද? 4) ප්‍රවේශ පත්‍ර ගන්නේ කොහෙද?

14. අම්මා කිරිබත් උයනවා.

1) අම්මා මොනවද උයනවා 2) අම්මා මොකක්ද උයනවා
3) අම්මා මොනවද උයන්නේ 4) අම්මා මොනවටද උයන්නේ

- අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල නිවැරදිව අකුරු යෙදී ඇති පදය තෝරන්න.
  15 – 17 வரையான வினாக்களுக்கான **எழுத்துப் பிழையற்ற** சொல்லைத் தெரிவு செய்க

15.1) බෙයිසිකලය 2) බයිසිකලය 3) බෛසිකලය 4) බයිසිකලජ
16.1) ගම් සබාව 2) කම් සභාව 3) ගම් සභාව 4) ගම් සපාව
17.1) කොට්ඨාශය 2) කොට්ටාසය 3) කොට්ඨාසය 4) කොට්ඨාෂය

- අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවල නොගැළපෙන පදය තෝරන්න.
  18 – 20 வரையான வினாக்களுக்கான **பொருத்தமற்ற** சொல்லைத் தெரிவு செய்க

18.1) පොත 2) සඟරාව 3) රූපවාහිනිය 4) පත්තරය
19.1) දොඩම් 2) ඇපල් 3) දෙහි 4) නාරං
20.1) කන්ද 2) තාරකා 3) ගංගාව 4) වැව

- අංක 21 සිට 23 තෙක් මුලින් දී ඇති පදයට සමානාර්ථ පදය තෝරන්න.
  13 – 14 வரையான வினாக்களுக்கான **ஒத்த கருத்துள்ள** சொல்லைத் தெரிவு செய்க

21. ශබ්දය 1) නිහඬ 2) නාදය 3) ගීතය 4) ආලෝකය
22. පොත 1) සඟරාව 2) පත්තරය 3) කෘතිය 4) පුවත
23. ජයග්‍රහණය 1) පැරදුම 2) පරාජය 3) දිනුම 4) පසුබට

- අංක 24 සිට 25 තෙක් මුලින් දී ඇති පදයට විරුද්ධ අර්ථ පදය තෝරන්න.
  24 – 25 வரையான வினாக்களுக்கான **எதிர் கருத்துள்ள** சொல்லைத் தெரிவு செய்க

24. පැරණි 1) පුරාණ 2) අලුත් 3) පැරණි 4) පෞරාණික
25. පිරිසිදු 1) නිර්මල 2) පිවිතුරු 3) අපවිත්‍ර 4) පවිත්‍ර

- අංක 26 සිට 28 තෙක් එක් එක් ප්‍රශ්නයේදී ඇති පින්තූරය සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
  26-28 வரையான வினாக்களிலுள்ள படங்களுக்கு **மிகப் பொருத்தமான கூற்றைத்** தெரிவு செய்க

26. 

1) ඩෙංගු මර්දනය කරමු.
2) ඩෙංගු මර්දනය නොකරමු.
3) ඩෙංගු නොවළක්වමු.
4) ඩෙංගු මර්දනය තහනම්.

27. 

1) අන්ධ පුද්ගලයින් පාර මාරුනොවන තැනකි.
2) අන්ධ පුද්ගලයින් පාර මාරු වන ස්ථානය ඉදිරියෙනි.
3 අන්ධ පුද්ගලයින් පාර මාරුවීම තහනම්.
4) අන්ධ පුද්ගලයින් මෙතනින් පාර මාරු වීමෙන් වළකින්න.



kalvi.lk

28. 

1) ඉදිරියේ පාසල් ළමුන් පාර මාරු නොවන ස්ථානයකි.
2) ඉදිරියේ මගීන් පාර මාරුවන ස්ථානයකි.
3) ඉදිරියේ පාසල් ළමුන් පාර මාරු වන ස්ථානයකි.
4) ඉදිරියේ මගීන් පාර මාරු නොවන ස්ථානයකි.

- අංක 29 සිට 30 තෙක් අසා ඇති ප්‍රශ්නවලට යෝග්‍ය පිළිතුරු සපයන්න.
  29 – 30 வினாக்களுக்கு **பொருத்தமான** விடை தருக.

29. පහත සඳහන් පද අතුරින් යුගල පදයක් නොවන්නේ?
   1) හොඳ නරක   2) ගනු දෙනු   3) අත් කම්   4) කසු කුසු

30. පෙරේදා බදාදා නම් හෙට කවදාද?
   1) බ්‍රහස්පතින්දා   2) සෙනසුරාදා   3) අඟහරුවාදා   4) ඉරිදා

- අංක 31 සිට 32 තෙක් එක් එක් ප්‍රශ්නවල වාක්‍ය දෙක සම්බන්ධ කර එක වාක්‍යයක් ලෙස නිවැරදිව ලියා ඇති වාක්‍ය තෝරන්න.
  31-32 வரையான வினாக்களுக்களில் வரும் தனி வாக்கியங்களில் பொருள் வேறுபடாதவாறு அமைந்துள்ள **தொடர் வாக்கியத்தைத்** தெரிவு செய்க

31.සීයා පැළයක් සිටවුවේය. සීයා වතුර වක්කළේය.
   1) සීයා පැළය සිටුවමින් වතුර වක්කළේය.
   2) සීයා පැළය සිටුවන්නට වතුර වක්කළේය.
   3) සීයා පැළය සිටුවා වතුර වක්කළේය.
   4) සීයා පැළය සිටුවනකොට වතුර වක්කළේය.

32.පාසලේ සීනුව නාද විය. සිසුහු පන්තිවලට ගියහ.
   1) පාසලේ සීනුව නාදවීමෙන් සිසුහු පන්තිවලට ගියහ.
   2) පාසලේ සීනුව නාදවූ පසු සිසුන් පන්තිවලට ගියහ.
   3) පාසලේ සීනුව නාදවෙමින් සිසුහු පන්තිවලට ගියහ.
   4) පාසලේ සීනුව නාදවෙද්දී සිසුන් පන්ති වලට ගියහ.

- අංක 33 සිට 34 තෙක් ප්‍රශ්නවල හිස්තැනට වඩාත්ම සුදුසු පදය තෝරන්න.
  33 – 34 வரையான வினாக்களுக்களில் கீறிட்ட இடங்களுக்குப் **பொருத்தமான** சொல்லைத் தெரிவுசெய்க.

33.............................. අහලා බලමු.
   1) සීයාට   2) සීයා ළඟ   3) සීයාගෙන්   4) සීයාගේ

34.අද ............................... බලන්න.
   1) පත්තරය   2) පත්තරයේ   3) පත්තරයට   4) පත්තරයව

35.ගංවතුර නිසා පන්සලේ පවුල් 1204 ක් පමණ අවතැන් වී සිටිති.
   ඉහත සඳහන් වාක්‍යයේ සංඛ්‍යාව නිවැරදිව ලියා ඇති ජේළිය තෝරන්න.
   மேற் குறிப்பிட்ட இலக்கம் சரியாக எழுதப்பட்ட விடையைத் தெரிவு செய்க.
   1) එකසිය දෙසිය හතරක්.   2) දොළහයි බිංදුවයි හතර.
   3) එක්දහස් දෙසිය හතරක්.   4) එකසිය විස්සයි හතරයි.

- අංක 36 සිට 40 තෙක් ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.
  36 – 40 வரையான வினாக்களுக்களில் கீறிட்ட இடங்களுக்குப் **பொருத்தமான** சொல்லைத் தெரிவுசெய்க.


kalvi.lk

36.

1) ක්‍රීඩකයෝ තරග වදියි.
2) ක්‍රීඩකයා තරග වදිති.
3) ක්‍රීඩකයන් තරග වදියි.
4) ක්‍රීඩකයෝ තරග වදිති.

37.

1) ගම් වැසියෝ පාලම ඉදි කළේය.
2) ගම් වැසියෝ පාලම ඉදි කළාය.
3) ගම් වැසියන් පාලම ඉදි කළෝය.
4) ගම් වැසියෝ පාලම ඉදි කළහ.

38.

1) අපි විභාගයට සූදානම් වෙමු.
2) අප විභාගයට සූදානම් වෙමු.
3) අපි විභාගයට සූදානම් වෙමි.
4) අප විභාගයට සූදානම් වෙමි.

39.

1) ගායිකාවද ගායකයාද ගී ගැයුවේය.
2) ගායිකාවද ගායකයාද ගී ගැයුවාය.
3) ගායිකාවද ගායකයාද ගී ගයන ලදී.
4) ගායිකාවද ගායකයාද ගී ගැයූහ.

40.

1) කම්කරුවන් විසින් වැව බඳින ලදී.
2) කම්කරුවෝ විසින් වැව බඳින ලදී.
3) කම්කරුවන් විසින් වැව බඳිනු ලැබූහ.
4) කම්කරුවෝ විසින් වැව බඳිනු ලැබූහ.

Education கல்வி අධ්‍යාපන

**64. දෙවන බස ( සිංහල)**
**II පත්‍රය**
**කාලය පැය 02 යි**

සැලකිය යුතුයි,

- I කොටසෙහි 1 හි 2 ප්‍රශ්නය ඇතුළුව II කොටසින් එක් ප්‍රශ්නයක්ද III කොටසින් ප්‍රශ්න දෙකක්ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
  பகுதி ஐ இலிருந்து 1ஆம் 2 ஆம் வினாக்களுக்கும் பகுதி II இலிருந்து ஏதாவது ஒரு வினாவுக்கும் பகுதி III இலிருந்து இரு வினாக்களுக்குமாக மொத்தம் ஐந்து வினாக்களுக்கு மட்டும் விடை எழுதுக.

**I කොටස**

01. දී ඇති මාර්ගෝපදේශ ආශ්‍රය කර ගනිමින් පහත දැක්වෙන මාතෘකාවලින් එකක් ගැන වචන 100 ක පමණ රචනයක් ලියන්න.
பின்வரும் தலைப்புக்களில் **ஒன்றைத்** தெரிவு செய்து தரப்பட்ட விடயங்களை உள்ளடக்கி ஏறத்தாள 10 சொற்கள் அமையுமாற கட்டுரை ஒன்று எழுதுக. ( ලකුණු 20)

(අ) ස්වාභාවික සම්පත් සුරකිමු,

i. ස්වාභාවික සම්පත් හඳුන්වා දීම.
ii. ස්වාභාවික සම්පත්වලින් ඇති ප්‍රයෝජන.
iii. ස්වාභාවික සම්පත් විනාශවෙමින් පැවතීම.


kalvi.lk

iv. ස්වාභාවික සම්පත් රැකගැනීමට කළහැකි දේ.
v. සමාලෝචනය හා නිගමනය.

(ආ) අපේ ගෙවත්ත,

i. ගෙවත්ත පිලිබඳ හැඳුන්වා දීම.
ii. ගෙවත්තේ වගා කළ හැකි දේ.
iii. ගෙවත්තෙන් ඇති ප්‍රයේජන.
iv. ඔබේ ගෙවත්තේ ස්වභාවය.
v. සමාලෝචනය හා නිගමනය.

(ඇ) වැඩිහිටියන්ට සළකමු,

i. වැඩිහිටියන් යනු කවුරුන්දැයි හැඳින්වීම.
ii. වැඩිහිටියන්ගෙන් සමාජයට සිදුවූ මෙහෙය.
iii. වැඩිහිටියන්ට සැලකිය යුත්තේ ඇයි?
iv. වැඩිහිටියන්ට සැලකිය යුත්තේ කෙසේද?
v. සමාලෝචනය හා නිගමනය.
vi.

(ඈ) මත් උවදුර පිටු දකිමු,

i. මත් උවදුර හැඳින්වීම.
ii. විවිධ පිරිස් මෙයට ඇබ්බැහි වීම .
iii. සෞඛ්‍යයට ඇති වන බලපෑම.
iv. මානසික සෞඛ්‍යය පිරිහීම.
v. සමාලෝචනය හා නිගමනය.

Education කල්වි අධ්‍යාපන

02. දී ඇති පින්තූරය බලා ඒ ඇසුරින් අර්ථවත් වාක්‍ය 05ක් ලියන්න. (වාක්‍යයක අවම වශයෙන් වචන 4 ක් වත් තිබිය යුතුය)

பின்வரும் படத்தை அடிப்படையாகக் கொண்டு ஐந்து கருத்துள்ள வாக்கியங்கள் எழுதுக.

(ஒரு வாக்கியத்தில் நான்கு சொற்களுக்கு குறையாமல் இருத்தல் வேண்டும்.) ( ලකුණු 10)





kalvi.lk

- 03, 04 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.

  03, 04 ஆம் வினாக்களுள் **ஒன்றுக்கு மட்டும்** விடை எழுதுக.

03. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
பின்வரும் உரைப்பகுதியை வாசித்து அதன் கீழ் தரப்பட்டுள்ள வினாக்களுக்கு விடை தருக.

අදහස් හුවමාරු කර ගැනීමේදී ප්‍රධාන වන්නේ භාෂාවයි. එහෙත්, පුද්ගලයින් අතර අදහස් හුවමාරු කර ගැනීමට යොදා ගන්නා එකම මාධ්‍යය භාෂාව නොවේ. කුඩා දරුවා තම අදහස් ප්‍රකාශ කරන්නේත් අවශ්‍ය දේ ලබා ගන්නේත් හැඬීමෙනි. වැඩිහිටියෝ අදහස් හුවමාරුවේදී හෙවත් සංදේශන ක්‍රියාවලියේදී සංකේත, සංඥා, මුද්‍රා, චිත්‍ර ආදිය ද උපයෝගී කොට ගනිති. ඉදිරියෙන් පාසලක් ඇත. නළාව හැඬවීම තහනම්, දුම් බීමෙන් වළකින්න, පාවහන් ගලවා ඇතුළු වන්න, කාන්තා වැසිකිලියකි වැනි නිවේදන වචනයෙන් ලියා තැබීමට වඩා සංකේත මගින් දැක්වීම සාර්ථකය. සංඥා භාවිතය අද විද්‍යාත්මක ලෝකයෙහි පවා ඵලදායි ක්‍රමය වශයෙන් පිළිගෙන ඇත.

1. අදහස් හුවමාරුවේදි ප්‍රධාන වන්නේ කුමක්ද?
2. හැඬීමෙන් කුඩා දරුවා කරන එක් දෙයක් ලියන්න.
3. වැඩිහිටියන් අදහස් හුවමාරුව සඳහා භාවිත කරන ක්‍රම දෙකක් ලියන්න.
4. සංකේත මගින් දැක්විය හැකි නිවේදන දෙකක් ලියන්න.
5. විද්‍යාත්මක ලෝකයෙහි වඩාත් ඵලදායි කුමය කුමක්ද? ( ලකුණු 10)

04. පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
பின்வரும் பாடலை வாசித்து அதன் கீழ் தரப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.

1. මේ රට මගෙ රට
   මා ඉපදුණු රට
   හැදෙන වැඩෙන රට
   මගේම මව් රට

2. සරු පස පොළවෙන්
   වැහි විදු අහසෙන්
   මිණිකැට මුතුකැට
   ඇති මගෙ සිරිලක

3. මගෙ සිරිලක ගැන
   ලොවට කියමි මම
   සුරපුරයක් වෙන
   ලොවේ මෙවැනි නැත

4. එඩිතරකම ඇත
   කම්මැලිකම නැත
   ළමයි සිටින රට
   මගෙ මේ සිරිලක

1. මෙම කවියෙන් කියැවෙන රට කුමක්ද?
2. මෙහි ඇතිබව කියැවෙන දේවල් 03 ක් ලියන්න.
3. මෙහි සිටින ළමයින්ගේ ස්වභාවය කුමක්ද?
4. ලෝකයට කියන්නේ කුමක් ගැනද? ( ලකුණු 10)



kalvi.lk

## III කොටස

- 05, 06 ප්‍රශ්න දෙකටම පිළිතුරු ලියන්න.
  05 ஆம் 06 ஆம் வினாக்களுக்கு விடை எழுதுக.

05. බණ්ඩාරගම පාසලේ 2018.01.03 වන දින පෙ. ව. 8.00 සිට ප. ව. 12.00 දක්වා පැවැත්වෙන ශ්‍රමදානයට සහභාගිවන ලෙසට දන්වා දෙමාපියන් වෙත යවන ලිපිය ලියන්න. පාසලේ පරිසර සංගමයේ ලේකම් ඔබ යැයි සිතන්න.
එදින පැමිණීමේදී උදලු ද කූඩා ද රැගෙන එන ලෙසද දන්වන්න.

නැතහොත්, அல்லது

බණ්ඩාරගම පාසලේ සිසු කුසලතා ඇගයීමේ උලෙළ 2017 නොවැම්බර් මස 25 වන දින පාසලේ ප්‍රධාන ශාලාවේදී පැවැත්වේ. උත්සවය පෙ.ව. 9.00 සිට ප.ව. 12.00 දක්වා පැවැත්වේ. මෙම උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස ප්‍රදේශයේ දිසාපතිතුමා සහභාගි කර ගැනීමට සංවිධායක කමිටුව තීරණය කර ඇත.
ඉහත තොරතුරු ඇතුළත් කර ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

06. පහත සඳහන් දෙමළ වාක්‍ය සිංහලයට පරිවර්තනය කරන්න.
பின்வரும் தமிழ் வாக்கியங்களை சிங்களத்தில் மொழி பெயர்க்குக.

1) யால சரணா
2) எமது நாடு அழகான தீவாகும்.
3) குமாரி தரம் 10 இல் கல்வி கற்கிறாள்.
4) உங்கள் பாடசாலையின் பெயர் என்ன.?
5) நாட்டின் மக்கள் தொகை அதிகரிக்கின்றன.

නැතහොත්, அல்லது

වෙළඳ සැලකින් භාණ්ඩ මිල දී ගැනීමට වෙළඳ සැලට ගිය අවස්ථාවේ වෙළඳසැල් හිමියා හා ඔබ අතර ඇතිවන කතාබහ පහත දැක්වෙන කරුණු උපයෝගී කොටගෙන සංවාදයක ස්වරූපයෙන් ඉදිරිපත් කරන්න.

i. ආමන්ත්‍රණය හා සුබ පැතීම.
ii. අවශ්‍ය භාණ්ඩ මිල ගණන් විමසීම.
iii. මිල දී ගන්නා භාණ්ඩය, වර්ගය පිළිබඳ විමසීම.
iv. භාණ්ඩය මිලදී ගැනීම, මුදල් ගෙවීම.
v. ස්තූතිය.

Education කල්වි අධ්‍යාපන



kalvi.lk

# 2025

## 1ம் தவணை வகுப்புகள்

**தரம் 6 முதல் 11 வரையான மாணவர்களிற்கான தமிழ் மற்றும் ஆங்கில மொழிமூல வகுப்புக்கள் ஆரம்பமாகவுள்ளன.**

**ஆரம்பம் 01.01.2025**

இலங்கையின் எப்பாகத்திலிருந்தும் Zoom app மூலம் எமது வகுப்புகளில் இணைந்து கொள்ள முடியும்.

அனைத்துப் பாடங்களும் ஒரே கல்வி நிறுவனத்தின் கீழ்...

Education கல்வி අධ්‍යාපන Kalvi.lk

Whatsapp
075 287 1457